# පරිසර අමාත්‍යාංශය

## වායු සම්පත් කළමනාකරණ සහ ජාතික ඕසෝන් ඒකකය

# දැන්වීමයි

### 2022 වසර සඳහා හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරොකාබන් (HCFCs) ආනයනික කෝටා ලබා ගැනීමට ලියාපදිංචි වීම

ශ්‍රී ලංකාව 1989 වසරේ සිට ඕසෝන් ප්‍රහීනකාරක ද්‍රව්‍යයන් භාවිතයෙන් ඉවත් කිරීම පිළිබඳ මොන්ට්‍රියල් සන්ධානයේ පාර්ශවකරුවෙකු ලෙස කටයුතු කරයි. පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය මොන්ට්‍රියල් සන්ධානයේ ප්‍රතිපත්තිමය තිරණ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ජාතික කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කරයි.

මොන්ට්‍රියල් සන්ධානයේ 19 වන පාර්ශවකරුවන්ගේ රැස්වීමේදී ගන්නා ලද තීරණ අංක XIX/6 ට අනුකූලව එම සන්ධානයේ සෑම පාර්ශවකාර රාජ්‍යයක්ම නිෂ්පාදනය කරනු ලබන සහ භාවිත කරනු ලබන හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරොකාබන් (HCFCs) ප්‍රමාණය අදියරගතව, ක්‍රමානුකූලව සහ සැලසුම් සහගතව අඩු කිරීමට එකඟත්වය පළ කර ඇත. ඒ අනුව, එක් එක් පාර්ශවකාර රාජ්‍යයන් විසින් එක් වසරක් තුළ උපරිම වශයෙන් භාවිත කළහැකි HCFCs ප්‍රමාණය සඳහා සීමාවන් පනවා ඇත. **තවද 2020 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා පාදක මට්ටමින් 35% ක ප්‍රමාණයක් අඩුකිරීමක් සිදුකරන අතර, මෙම කාලය තුළ ආනයන කෝටා ප්‍රමාණය එම පදනම මත තීරණය වේ.** ශ්‍රී ලංකාව එසේ හිමිකම් ලබන HCFCs ප්‍රමාණය එනම් කෝටාව සෑම වර්ෂයක් ආරම්භයේදීම සුදුසුකම් ලබන වෙළඳ ආයතන වෙත නිසි ක්‍රමවේදයකට අනුකූලව නිල වශයෙන් පත් කරනලද කමිටුවක් මගින් බෙදා දෙනු ලබයි .

ඒ අනුව පසුගිය වසර 5ක (2017-2021) හෝ ඊට වැඩි කාලයක් තුළ HCFCs ශීතකාරක ආනයනය කරන ලද වෙළඳ ආයතන මෙන්ම ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ අනෙකුත් කාර්යයන්හි නියැලී ඇති බවට සහතික කළ හැකි ආයතන එනම්, HCFCs ශීතකාරක භාවිතා කර ශීතකරණ හා වායු සමන උපකරණවල සේවා හා නඩත්තු කටයුතු, සවිකිරීම හා එකලස් කිරීම කටයුතු සිදු කරනු ලබන වෙළඳ ආයතන 2022 වසර සඳහාද HCFCs කෝටා ලබා ගැනීමට සුදුසුකම් ලබනු ඇත. 2022 වසර සඳහා HCFCs ආනයනික කෝටා ලබා ගැනීමට උනන්දුවක් දක්වන වෙළඳ ආයතන විසින් පරිසර අමාත්‍යාංශය වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළයුතු අතර, පහත සඳහන් කාණ්ඩ දෙක යටතේ එම අයදුම්පත්‍ර සලකා බැලීමට නියමිත වේ.

1. පසුගිය වසර 5ක (2017-2021) HCFCs ශීතකාරක භාවිතා කර ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ සේවා සැපයීම් හා නඩත්තු කටයුතු, සවිකිරීම හා එකලස් කිරීම් සිදුකරනු ලබන වෙළඳ ආයතන
2. පසුගිය වසර 5ක (2017-2021) HCFCs ශීතකාරක ආනයනයේ පමණක් නියැලී සිටින වෙළඳ ආයතන

**ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පහත තොරතුරු ලබාදීම අනිවාර්ය බව කාරුණිකව සළකනු මැනවි.**

01. ආයතනයේ නම :
02. හිමිකරුගේ නම :
03. ආයතනයේ ලිපිනය :
04. හිමිකරුගේ ලිපිනය :
05. දුරකථන අංකය සහ කාර්යාලීය විද්‍යුත් ලිපිනය :
6. ව්‍යාපාර ලියාපදිංචි අංකය හා දිනය :
07. ව්‍යාපාරයේ ස්වභාවය :
08. ආදායම් බදු අංකය (අදාල වේ නම්) :
09. TIN අංකය (අදාල වේ නම්) :
10. VAT අංකය (අදාල වේ නම)
11. HCFC ශීතකාරක ආනයනය හෝ HCFCs ශීතකාරක භාවිතා කර සේවා සැපයීම් හා නඩත්තු කටයුතු, සවිකිරීම් හා එකලස් කිරීම් පිළිබඳ පළපුරුද්ද:
    (HCFCs ශීතකාරක ප්‍රමාණයන් 2021 ඇතුලුව පසුගිය වසර 5ක් (2017-2021) තුළ එක් එක් වසර වලදී සිදු කල ආනයනයන්/ සේවා සැපයීම් හා නඩත්තු කටයුතු, සවිකිරීම් හා එකලස් කිරීම් සඳහා)
12. 2022 වසර සඳහා කෝටා ආනයනය කිරීමට අයදුම් කරන HCFCs වර්ගය හා ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්):

ඉහත තොරතුරු සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. **එසේ අයදුම්පත සමඟ අදාළ වලංගු ලියවිලි ඉදිරිපත් නොකරන වෙළඳ ආයතන සිදුකරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.** අවශ්‍ය වන්නේ නම් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, ලබා දෙන කෝටා ප්‍රමාණය ඉහත කමිටුව මගින් නිර්දේශ කෙරෙනු ඇත. මේ පිළිබඳව පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත් අවශ්‍ය ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත්ද සමග **2021 දෙසැම්බර් මස 27 දින ප.ව. 4.00 ට පෙර අධ්‍යක්ෂ, වායු සම්පත් කළමනාකරණ සහ ජාතික ඕසෝන් ඒකකය, පරිසර අමාත්‍යාංශය, 'සොබාදම් පියස', 416/C/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල** යන ලිපිනයට ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් හෝ noulanka@gmail.com විද්‍යුත් තැපැල වෙත යොමු කළ යුතුය.මේ සම්බන්ධ වැඩි විස්තර 0112034221 හෝ 0112034218 යන දුරකතන අංක ඔස්සේ ලබාගතහැකි බවද සලකන්න.

**ලේකම්,**
**පරිසර අමාත්‍යාංශය,**
**බත්තරමුල්ල.**